**අනුරාධපුර මහා නගර සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අනුරාධපුර මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) ( ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.3 නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සිට හීන වන ශේෂ ක්‍රමය අනුව ස්ථාවර වත්කම් ක්ෂය කරන බවට ප්‍රතිපත්තිවල සඳහන් කර තිබුණු නමුත් කාර්යාල උපකරණ හා වාහන සම්බන්ධයෙන් සඳහන් කර තිබුණු අපේක්ෂිත ඵලදායී ජීව කාලය අනුව එම ක්ෂය ප්‍රතිශතය නිවැරදි නොවුණි. | ප්‍රත්‍යාගණන වටිනාකම අනුව ක්ෂය ගණනය කර ඇත. | වත්කම්වල ඵලදායී ජීවකාලය අනුව ක්ෂය ප්‍රතිශතය නිවැරදි විය යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උසාවියේ ලද ආදායම් විස්තර අනුව සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.373,664 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.264,917 ක් ලෙස රු.108,747 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ උසාවි දඩ ආදායම් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි. | උසාවියෙන් ලද සනාථ කිරීම් අනුව උසාවි දඩ ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතු ගිණුම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.183,370 ක් වූ තැන්පතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2020 වර්ෂයේ ස්ථාවර තැන්පතු ප්‍රකාශනයේ සඳහන් පොලී මුදල 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ වැරදීමකින් දක්වා ඇති නිසා මෙම ස්ථාවර තැන්පතුව සඳහා ලද පොලී මුදල ගණනය කර නොමැත. | නිවැරදි ගිණුම් කාලපරිච්ඡේදයට ස්ථාවර තැන්පත් පොලිය ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිකිරීම් යන්ත්‍ර කුලියට දීමේ ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර කුලියට දීමෙන් ලැබුණු ආදායම රු.5,205,250 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.5,921,492 ක් ලෙස රු.716,242 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ නිවැරදි කිරීම් සිදු කරමි. | නිවැරදි ආදායම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | උපලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් දායක වියදම රු.4,633,572 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,652,844 ක් ලෙස රු.19,272 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ නිවැරදි කිරීම් සිදු කරමි. | නිවැරදි වියදම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අනියම් සේවක වැටුප් වියදම රු.1,282,439 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී වැටුප් ගෙවීම් උපචිත පදනමට ගිණුම් තැබීමට කටයුතු කරමි. | ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ නිවැරදි වියදම ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම සහ සමුච්චිත අරමුදල රු.16,947,339 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාළ ගැලපීම ඉදිරි ගිණුම් වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරමි. | සමාලෝචිත වර්ෂයට අදාළ නිවැරදි මුද්දර බදු ආදායම ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | මහා නගර සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු ව්‍යාපෘති 15 කට අදාළව සමාලෝචිත වර්ෂයේ වියදම සහ සැපයුම් ණයහිමියන් රු.4,150,491 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම වැරදීම ඉදිරි වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි ණයහිමි වටිනාකම් ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඌ) | මහා නගර සභාව සතු වටිනාකම රු.121,000,000 ක් බවට හඳුනාගෙන තිබුණු ගොඩනැගිලි 02 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ රු.6,050,000 ක ක්ෂයවීම් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ක්ෂය වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදි ස්ථාවර වත්කම් වටිනාකම හඳුනාගෙන ඒ සඳහා ක්ෂයවීම් ගණනය කළ යුතුවේ. |
| (එ) | ව්‍යාපෘති ප්‍රගති වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභා අරමුදලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 කට අදාළ ණයහිමි ශේෂය රු.12,586,108 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනයේ එය රු.14,193,304 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ණයහිමියන් රු.1,607,196 කින් වැඩි වී තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 03 ට අදාළව රු.14,193,303 ක ණයහිමි ශේෂයක් ඇත. | නිවැරදි ණයහිමි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.4,025,861 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගිණුමේ ශේෂය හා උපලේඛනයේ ශේෂය නිවැරදි කර ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර අදාළ නිවැරදි කිරීම් සිදුකළ යුතුවේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| | xix වැනි පරිච්ඡේදයේ 5.3.1 සහ 7.2 වගන්ති | උපලේඛනගත රජයේ නිවාසයක පදිංචි වීමේදී විවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට දහයක් (10%) අයකරගත යුතු වුවත් හිටපු නාගරික කොමසාරිස් වරයාගෙන් 2009 නොවැම්බර් සිට 2016 ජූනි දක්වා රු.201,017 ක් සහ 2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලයට අයවිය යුතු රු.99,662 ක නිවාස කුලී අයකරගෙන නොතිබුණු අතර අනුමැතියක් රහිත කාලයට දණ්ඩන කුලී රු.273,949 ක්ද අයකරගෙන නොතිබුණි. එසේම මෙම නිලධාරියා සම්බන්ධව 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ කටයුතු කිරීම සිදුකර නොතිබුණි. | 2009 ඔක්තෝබර් 13 දින පැවති මහා සභාවේ තීරණ අංක 44 යෝජනා අංක 05(48) යටතේ නාගරික කොමසාරිස් වරයාට කුලී ගෙවීමකින් තොරව නිළ නිවාසයේ පදිංචි වී සිටීමට අවසර ලබාදීමට තීරණය කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.46,960,582 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.47,891,094 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මහා නගර සභාව නමින් රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු ඇපයට තබා කඩිනමින් නිරවුල් කිරීමේ පදනම මත 2019 අප්‍රේල් මස ලබාගෙන තිබුණු රු.14,400,000 ක ණය මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට ණය වාරික වශයෙන් රු.3,203,854 ක්ද පොලී වශයෙන් රු.2,178,018 ක්ද ගෙවා තිබුණු අතර තවත් රු.11,196,146 ක් ගෙවිය යුතුව තිබුණි. | වසර කිහිපයක් තිස්සේ ආදායම් අහිමිවීම හේතුවෙන් පැන නැගුණු මූල්‍ය අපහසුතා හේතුවෙන් මෙම ණය මුදල පියවීමට නොහැකිවීම නිසා සාමාන්‍ය ණය මුදලක් ලෙස පවත්වාගෙන යනු ලැබේ. | ස්ථාවර තැන්පත් ඇපයට තබා ලබාගන්නා ණය මුදල් කඩිනමින් පියවිය යුතුවේ. |

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2020 දෙසැම්බර් 31 දිනට රු.96,822,402 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වරිපනම් බදු එකතු කිරීමේ ප්‍රතිශතය වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | වරිපනම් බදු හිඟය වාර්ෂිකව වැඩිවී ඇති බැවින් හිඟ මුදල් අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| **(ආ) කුලී** | | |
| 2020 දෙසැම්බර් 31 දිනට රු.45,698,842 ක්වූ හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීම සඳහා විධිමත් පරිදි ලිපි නිකුත් කර ඇති අතර කඩ හිමියන්ගේ ඉල්ලීම් සඳහා මහා සභා තීරණ අනුව ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී. | හිඟ කඩකුලී අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අවධානය යොමු කළ යුතුවේ. |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ බලපත්‍ර ගාස්තු හිඟය රු.5,238,635 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කරමින් ඇත. | හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ක්‍රියා කළයුතුවේ |
| (ii) | විධිමත් අනුමැතියක් නොමැතිව සමාලෝචිත වර්ෂයේදී වෙළඳ බලපත්‍ර ණයගැතියෝ රු.3,906,584 ක් කපාහැර තිබුණි | ද්වි ගණන දෝෂ සහ ව්‍යාපාර වසා දැමීම වැනි හේතුමත මෙම ණයගැති ශේෂ කපාහැර ඇත. | ණයගැතියන් කපාහැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුවේ. |

**(ඇ) මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙක් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුද්දර ගාස්තු රු.42,390,277 ක් වූ නමුත් එම මුදල් ලබාගැනීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට ක්‍රියා කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිරික්කුලම පිළිසරු ව්‍යාපෘතිය සඳහා යොදවා තිබූ එක්ස්කැවේටර් යන්ත්‍රය 2014 සැප්තැම්බර් 18 දින ගිනි ගැනීම සම්බන්ධයෙන් පැවැත්වූ මූලික විමර්ශන වාර්තාව අනුව රු.මි.3.3 ක අලාභයෙන් හතරෙන් එකක වටිනාකම වන රු.825,000 ක් අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතු බවට එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණු නමුත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මූලික විමර්ශණයක් සිදුකර ඇති අතර සහ විනය නියෝග ලැබීමෙන් පසු ඒ අනුව ක්‍රියා කරමි. | අදාළ විනය නියෝග කඩිනමින් ලබාගෙන වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාකළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2012 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ මහා නගර සභාවේ සිදු වී තිබුණු අක්‍රමිකතාවයන් දෙකකින් සහා අරමුදලට සිදුවී තිබුණු රු.47,174,493 ක මූල්‍යමය අලාභය පියවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් බදු අක්‍රමිකතාවය සම්බන්ධයෙන් සිදුකරන ලද විධිමත් විනය පරික්ෂණය අනුව වරදකරුවී ඇති පාර්ශවයන්ගෙන් රු.6,322,302 ක් අයකිරීමට විනය නියෝගය ලබාදී ඇති නමුත් ඒ සඳහා ඔවුන් අභියාචනා ඉදිරිපත් කර ඇත. වැටුප් වංචාව සඳහා විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නැත. | වරිපනම් බදු වංචාව සඳහා විධිමත් විනය පරීක්ෂණය අනුව අදාළ අයකරගැනීම සිදුකල යුතු අතර වැටුප් වංචාව සඳහා කඩිනමින් විනය පරීක්ෂණ පවත්වා අයකර ගැනීම සිදුකළ යුතුවේ. |
| (ඇ) | මහා නගර සභාවේ සේවය කර 2013 වර්ෂයේදී වෙනත් ආයතනයකට ස්ථාන මාරුවී ගොස් තිබුණු සේවකයෙකුට ස්ථාන මාරුවී ගිය දින සිට 2018 ජූනි මස දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් සහ දීමනා ලෙස රු.1,816,557 ක් ගෙවීම් කර තිබීම නිසා අරමුදලට සිදුවී තිබුණු මූල්‍යමය අලාභය පියවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදුකර මුදල අයකර ගැනීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා ඇත. | මෙම මුදල් අයකර ගැනීම සඳහා කඩිනමින් ක්‍රියකළ යුතුවේ. |
| (ඈ) | මහා නගර සභාවේ සේවයේ නියුතුව සිට වැඩ තහනමට ලක්වී සිටින සේවකයන් 15 දෙනකුගෙන් අයවිය යුතු රු.699,227 ක් වර්ෂ දෙකකට අධික කාලයක් තිස්සේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩ තහනමට ලක් වූ සේවකයන් සඳහා මූලික විමර්ෂණ කටයුතු සිදුකරමින් පවතින අතර එම විමර්ෂණ කටයුතු අවසන් වූ වහාම අයකිරීම් සිදු කරමි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා කඩිනමින් ක්‍රියකළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් තුළ ඇතුළත් හඳුනානොගත් රු.399,328 ක් ලැබිය යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය ගැතියන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකර මුදල් අය කිරීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඊ) | 2014 සිට 2019 වර්ෂය දක්වා වූ කාලයට අදාළව නොගෙවූ විගණන ගාස්තු රු.2,930,450 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මහා නගර සභාවේ ඇතිවී තිබෙන මූල්‍ය අපහසුතා නිසා සහා තීරණ අනුව මාසිකව රු.100,000 බැගින් ගෙවීම් කිරීමට තීරණය කර ඇත. | විගණන ගාස්තු ප්‍රමාද නොකර ගෙවීමට කටයුතු කළයුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහා නගර සභාව සතු සතිපොළ සඳහා 2020 ජුනි 06 දින සිට ගෙවිය යුතු රු.928,442 ක බදු මුදල් සහ රු.188,030 ක විදුලි බිල්පත් නොගෙවීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීතිමය කටයුතු කිරීම සඳහා නීති අංශය වෙත යොමුකර ඇත. | අදාළ හිඟ මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියාකළ යුතුවේ. |